# සාමාන්‍ය සමයේ විසිදෙවන සතිය
# අඟහරුවාදා

## පළමුවන දේව ප්‍රකාශනය

ශුද්ධවූ පාවුලු තුමන් විසින් තෙසලෝනිකවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් කොටසකි.

1 තෙසලෝනික 5: 1-6, 9-11

"අප සමඟ එක්ව ජීවත් වන පිණිස ක්‍රිස්තුස් වහන්සේ අප උදෙසා මළ සේක."

සහෝදරවරුනි, මේවා සිදුවන කාලවේලා හා අවස්ථා ගැන ඔබට ලියා එවීම අවශ්‍ය නැත. මන්ද, රාත්‍රියෙහි පැමිණෙන සොරෙකු මෙන් ස්වාමින් වහන්සේගේ දවස පැමිණෙන බව ඔබ ම හොඳහැටි දන්නහු ය. 'සාමය ඇත. අනතුරක් නැතැ'යි ඔවුන් කියන විට, ගැබ්ණියකට විළිරුජා පැමිණෙන්නාක් මෙන්, ක්ෂණික විනාශය ඔවුන් පිට පැමිණේ. ඔවුන්ට කිසි ගැලවීමක් නැත.

එහෙත් සහෝදරවරුනි, ඔබ අන්ධකාරයෙහි නොසිටින නිසා, ඒ දවස සොරෙකු මෙන් ඔබ වෙත පැමිණීමට හේතුවක් නැත. ඔබ සැම, ආලෝකයේ දරුවෝ ද, දිවා කාලයේ දරුවෝ ද වන්නහු ය. අපි රාත්‍රි කාලයේ වත් අන්ධකාරයේ වත් දරුවෝ නොවන්නෙමු. ඒ නිසා අපි, අන් අය මෙන් නිදා නොසිට අවදි ව, සිහි කල්පනා ඇතිව සිටිමු. දෙවියන් වහන්සේ අපට නියම කළේ දේව උදහස නොව, අපගේ ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ කරණකොටගෙන, ගැලවීම ලබා ගැනීම ය. අප අවදි ව සිටියත්, නිදා සිටියත්, තමන් වහන්සේ සමඟ එක්ව ජීවත් වන පිණිස ක්‍රිස්තුස් වහන්සේ අප උදෙසා මළ සේක. එබැවින් ඔබ දැනට ම

කරන්නාක් මෙන්, එකිනෙකාට ධෛර්යය දෙන්න, එකිනෙකා ශක්තිමත් කරන්න.

දේව වචනය මෙසේ ය

## පිළිතුරු ගීය

ගීතාවලිය 27: 1, 4, 13-14

පිළිතුර: සමිඳුන්ගේ යහපත්කම ජීවතුන් අතර මම අත්දකිම්.

ගීය:

හිමිසඳ මාගේ ආලෝකය හා විමුක්තිය ය. මම කිසිවෙකුට බිය නොවෙමි. හිමිසඳ මාගේ ජීව ශක්තිය ය. මට භීතියක් නැත.

හිමිතුමන්ගෙන් එකම යැදුමක් යදිමි. එය තරයේ සොයන්නෙමි. එනම්, හිමිතුමන්ගේ ශෝභාලංකාරය නරඹන පිණිසත්, දේව මාළිගාවේ දී උදය භාවනා කරන පිණිසත් මා දිවි ඇතිතාක් හැමදා සමිඳුන්ගේ මන්දිරයේ විසීම ය.

'ජීවතුන් අතර සමිඳුන්ගේ යහපත්කම මට දක්නට ලැබේ ය'යි මම විශ්වාස කරමි. සමිඳුන් කෙරේ විශ්වාසය තබන්න. ශක්තිමත් වන්න. ධෛර්යයවත් වන්න. සමිඳුන් කෙරේ විශ්වාසය තබන්න.

## සුපුවත් ජය නද

ආලේලූයා! ආලේලූයා!
දෙවියන් වහන්සේගේ වචනය ජීවමානය. ක්‍රියාශීලීය. සිතේ සිතුවිලි ද අරමුණු ද විමසන්නේය.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
ශ්‍රේෂ්ඨ දිවැසිවරයෙක් අප අතර පහළ වී සිටී.
දෙවියන් වහන්සේ සිය සෙනඟ ගළවන්නට වැඩිය සේක.
ආලේලූයා!

# සුවිශේෂය

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ලූක් 4: 31–37

"ඔබ දෙවියන් වහන්සේගේ ශුද්ධවරයාණෝ ය."

ජේසුස් ස්වාමින් වහන්සේ ගලීලයේ නුවරක් වන කපර්ණාවුමට පැමිණ, සබත් දිනයේ දී අනුශාසනා කරමින් සිටි සේක. උන්වහන්සේ බලධාරීන් කෙනෙකු මෙන් කතා කළ බැවින් ඒ අනුශාසනා ගැන සෙනඟ විස්මිත වූහ. අශුද්ධාත්මයන් ආවේශ වූ මිනිසෙක් ධර්ම ශාලාවෙහි සිටියේය. ඔහු මහ හඬින් මොරගසා, "අහෝ! නාසරෙත්හි ජේසුස් තුමෙනි, ඔබත් අපත් අතර මොන ගනුදෙනුවක් ද? ඔබ ආවේ අප වනසන්නට ද? ඔබ කවරෙක් දැයි දනිමි. ඔබ දෙවියන් වහන්සේගේ ශුද්ධවරයාණෝ ය"යි කීය.

ජේසුස් වහන්සේ ඔහුට තරවටු කරමින්, "කට පියාගෙන මොහුගෙන් ඉ රැවෙව"යි වදාළ සේක. එවිට යක්ෂයා සමූහයා ඉදිරියෙහි ඔහු බිම හෙළා ඔහුට තුවාල නොකොට ඔහුගෙන් දුරු විය. සියල්ලෝම විස්මිතව 'මේ මොන ධර්මයක් ද? මෙතුමා බලධාරීව ද මහානුභාව ඇතිව ද අශුද්ධාත්මයන්ට අණ දෙන සේක. ඔව්හු පලා යති'යි තම තමන් අතර කතා කර ගත්හ. උන්වහන්සේ පිළිබඳ මෙ පුවත අවට පෙදෙස පුරා පැතිරිණි.

සමිඳාණන් වහන්ගේ සුභාරංචිය මෙසේ ය